## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2015

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බැලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02**

මූල්‍ය ප්‍රකාශනවලට අනුකූලව හා නිවැරදි වර්ගීකරණයන් අනුගමනය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03**

ප්‍රමිතිය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ කරන ලද රු.85,151,639 ක වැරදි නිවැරදි කිරීම් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09**

ප්‍රමිතිය ප්‍රකාරව සේවා සැපයීමේදී පාවිච්චි කිරීම සඳහා හෝ බෙදා හැරීම සඳහා ද්‍රව්‍ය හෝ සැපයුම් ස්වභාවයෙන් පවතින භාණ්ඩ පමණක් තොග මැනීම සඳහා අදාල කරගතයුතු නමුත්, වටිනාකම රු.167,300ක් වූ උපාධි සාටක 1,394ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකර අවසන් තොග වටිනාකමට ගෙන තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගනුදෙනුවක්, වෙනත් සිදුවීමක් හෝ තත්ත්වයක් කෙරෙහි ව්‍යවහාර වන නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති විට කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යවහාර කළ යුතු වුවත් කල්බදු මත මිලදී ගත් මෝටර් වාහන සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව"21 වැනි සහශ්‍රය සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය "( HETC)" මගින් විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබූ රු.54,768,373 ක් වටිනා පිරියත උපකරණ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ වටිනාකම රු.812,270 ක්වූ ව්‍යායාම් උපකරණ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයේ තොග ලේඛන අනුව 2015 දෙසැම්බර් 31 දිනට පොත් අගය රු.521,574 ක් වූ ඖෂධ තොගය වත්කමක් ලෙස ගිණුම්ගත නොකර වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන රු.62,634,019 ක් වුවද වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ එය රු.61,896,869 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

**--------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලේඛනය අනුව නොපිය වූ අත්තිකාරම් එකතුව රු.1,296,585 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු.2,543,008 ක් ලෙස දැක්වීමෙන් රු.1,246,423 ක වෙනසක් විය.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

(අ) එකතුව රු.1,743,500ක් වූ සේවක ණය ශේෂ 46 ක් මාස 03 සිට වසර 12 දක්වා කාල පරාසයක සිට මාසික වාරික වශයෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) වසර 13 කට අධික කාලයක සිට පෙන්නුම් කෙරෙන විවිධ ණයගැතියන් රු.105,525 ක ශේෂයක් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන එකතුව රු.71,483 ක් වූ ගෙවිය යුතු සේවක වේතන නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට පැවත එන ලැබිය යුතු විවිධ තැන්පතු රු.358,897ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) වර්ෂ 05 ක සිට වර්ෂ 10ක් දක්වා එකතුව රු.8,182,519ක කොන්ත්‍රාත් රැඳවුම් මුදල් හා ලංසු සුරක්ෂණ ඇප ශේෂ 30 ක් නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) 2014 වර්ෂයේ දී ශිෂ්‍යාධාර ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාගත් රු.4,488,000 ක අත්තිකාරම් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-------------------------------------**

පහත සඳහන් ගිණුම් විෂයයන් සනාථ කරගැනීම සඳහා ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | (රු) | |
| ඉඩම් | 51,136,392 | හිමිකම් සහතික / පැවරුම් නියෝග |
| ගොඩනැගිලි | 2,406,003,853 | (i) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(ii) ස්ථාවර වත්කම් ලේඛණ |
| ජල පිරිපහදු ඒකකය | 9,113,148 | |
| කාර්යාල ඉගැන්නුම් උපකරණ | 446,784,574 | |
| පුස්තකාල පොත් හා සඟරා | 125,689,726 | |
| මෝටර් වාහන | 120,261,792 | |
| සන්නිවේදන උපකරණ | 28,961,134 | |
| උපාධි ලෝගු | 2,832,212 | |
| වෙනත් උපකරණ | 139,638,552 | |
| එකතුව | 3,330,421,383 | |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| (i) 108 (3) (2) වගන්තිය | විගණකාධිපතිවරයාගේ වාර්තාව නිකුත්කර එහි පෙන්නුම් කරන ලද කරුණු සම්බන්ධයෙන් ගන්නා ලද හෝ ගැනීමට යෝජිත පියවර මාස තුනක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු නමුත් 2014 වර්ෂයේ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ii) 109 වගන්තිය | ඉකුත් වර්ෂයන්ට අදාලව විගණනය කරන ලද ගිණුම් වාර්තා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| (ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 (1) වගන්තිය | එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම් සිදු කිරීමේ දී ඒ සඳහා සැපයුම්කරුවන්ගේ වලංගු බදු ඉන්වොයිසියකට පමණක් ගෙවීම් කළ යුතු නමුත් 2015 වර්ෂයේ සැපයුම්කරුවන්ට මුදල් ගෙවීමේ දී රු.105,179ක් වූ අගය එකතු කිරීම මත බදු මුදල් වෙනුවෙන් වලංගු බදු ඉන්වොයිසියක් සැපයුම්කරුවන්ගෙන් ලබා නොගෙන ගෙවීම් සිදුකර තිබුණි. |
| (ඇ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (1) (අ) වගන්තිය | කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවැය රු.මිලියන 05 ඉක්මවන විට, අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් |

පසු දින 60 ක් ඇතුළත ප්‍රසම්පාදන ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි කළ යුතු වුවද,සමාලෝචිත හා ඉකුත් වර්ෂවලදී එකතුව රු.118,538,421ක් වූ කොන්ත්‍රාත්තු 09 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර තිබේ ද යන්න පරීක්ෂාකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
-------------------------------------------

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි103(1) (ආ) | සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ වාහන අනතුරු දෙකක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 (1) | පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ වහාම ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කළ යුතු නමුත්, වාහනයට අදාලව සිදුවූ රු.498,062 ක අලාභය සම්බන්ධයෙන් එකී විධි විධාන ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104 (4) | අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මාසයක් ඇතුළත දී හානි සම්බන්ධව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී සිදු වූ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | 2015 දෙසැම්බර් 31 දිනට රු.30,053,325 ක් වූ තැන්පතුවලට අදාළව කාල විශ්ලේෂණයක් සකස් කර ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසිය II වන කොටසේ XVIII වැනි පරිච්ඡේදයේ 1646 | ධාවන සටහන් පොතේ මාසික සාරාංශය පිළියෙල කළ යුතු වුවද විශ්වවිද්‍යාලය මගින් ධාවනය කරනු ලබන වාහන 40 සම්බන්ධයෙන් එසේ ක්‍රියාකර නොතිබුණි. |

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

---------------------------------------------

| | |
|---|---|
| (i) v වැනි පරිච්ඡේදයේ 7.6 ඡේදය | ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම සම්බන්ධයෙන් 2010 ට පෙර ගිවිසුම් අත්සන් කරන ලද නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.48,152,247 ක මුදලක් සහ 2010 ට පසු ගිවිසුම් අත්සන් කරන ලද නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.13,025,762 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන |

| | |
|---|---|
| | නොතිබුණි. |
| (ඊ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (I) 5.4.12 මාර්ගෝපදේශය | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 දින හෝ එදිනට පෙර, එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව,දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු නමුත් අවස්ථා 38 කදී වටිනාකම රු.915,736 ක් වූ වැට් බදු ගෙවීම් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (II) 9.8 මාර්ගෝපදේශය | ලංසු කැඳවීමේ ආරාධනා පිළිබඳව විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ දැන්වීම් පලකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | වටිනාකම රු.215,063,581ක පරිගණක හා උපාංග සම්බන්ධයෙන් වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඌ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ යහපාලනය පිළිබඳව වූ උපදෙස් මාලාවෙහි 07 පරිච්ඡේදයෙහි 7.1 හා 7.2 ඡේද | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. |
| (එ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| (i). 2015 ජුලි 10 දිනැති අංක 02 /2015 දරන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල නිකරුනේ තිබෙන ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් හැකි ඉක්මනින් අපහරණ කිරීමට කටයුතු කළ යුතු වුවත් ගර්හිත තත්ත්වයේ පවතින අත්ට්‍රැක්ටරය හා ටේලර් 03 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ii). 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 17 වන දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ද පිටපත් සහිතව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,162,467 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.16,473,034 ක ඌනතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.30,689,433 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.205,644,870 කින් වැඩි වී තිබුණද පුද්ගල පඩිනඩි රු.163,756,738 කින්, මහපොළ හා ශිෂ්‍යාධාර වියදම රු.41,211.950 කින් හා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම රු.18,355,697 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.131,450,782 ක් වූ ඌනතාවය 2015 වර්ෂය වන විට රු.47,162,467 ක් දක්වා අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2011 වර්ෂයේ රු.273,042,356 ක සිට 2015 වර්ෂය වන විට රු.889,966,473 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2015 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් 0.52 ක් හා 0.38 ක් විය. සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම්වලින් සියයට 66 ක් මුදල් හා මුදල් සමාන දෑ වලින් නියෝජනය වූ අතර ආයතනයේ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**(අ) විශ්වවිද්‍යාලයට අභ්‍යන්තර සිසුන් ලියාපදිංචි කර ගැනීම**

2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 1215 ක් බඳවා ගැනීමට සැලසුම්කර තිබුණද ලියාපදිංචි වී තිබුණේ සිසුන් 1101 ක් පමණි.

**(ආ) ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2010 ඔක්තෝබර් 15 දිනැති අංක 932 දරන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව 2011 වර්ෂයෙන් පසුව පාඨමාලාව නවීකරණය කර ආරම්භ කළ යුතුව තිබුණි. අදාල චක්‍රලේඛ නිකුත් වී වර්ෂ හතරකට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද, නව ශිෂ්‍ය කණ්ඩායම් බඳවා ගැනිමට විගණිත දිනය වූ 2016 ජූනි 10 දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ඉහත පාඨමාලාව සඳහා අවසන් වරට 2011 වර්ෂයේ සිසුන් බඳවාගෙන මේ වන විට වර්ෂ හතරකට වැඩි කාලයක් ඉකුත්වී තිබුණද, එම කණ්ඩායම සඳහා පළමු හා දෙවන වසරේ විභාග සඳහා විශාල කාල පමාවක් තිබූ අතර විගණිත දිනය වූ 2016 ජූනි 10 දින වන විටත් තෙවන වසර විභාගය පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් එම වර්ෂයේ ලියාපදිංචි වී තිබූ සිසුන් 180 ක ගෙන් සිසුන් 99 ක් එනම් සියයට 55 ක් පාඨමාලාව හැර ගොස් තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ 2014-2018 සංයුක්ත සැලැස්ම අනුව 2015 වර්ෂයේ ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව ලඟා වීමට අපේක්ෂිත ශ්‍රේණිය 7000 ක් වුවද නිර්නායක සපුරාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා හිමි වී තිබුණේ 12277 ස්ථානය වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්ථාන 1478 කින් පහත බැසීමක් විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සෑම මාසයකම බාහිර උපාධි පාඨමාලා මගින් ඉපයූ ආදායමින් රු.මිලියන 06 ක පමණ මුදල් ශේෂයක් ජංගම ගිණුම්වල තිබුණද ඒවා ආයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපකුලපති අරමුදලෙහි රු.4,664,411ක් තිබූ නමුත් අරමුදල පිහිටුවීමට මූලික වූ අරමුණු විගණනයට ඉදිරිපත් නොවුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

--------------------------

**පානීය ජලය සැපයීම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1986 වර්ෂයේ සමනල වැව ජලාශ යෝජනා ක්‍රමය සඳහා ඉදිකරන ලද ජල පවිත්‍රාගාරය විශ්වවිද්‍යාලයේ ජල අවශ්‍යතාවය වෙනුවෙන් මේ වන විටත් භාවිතා කරනු ලබයි. එම ජල පවිත්‍රාගාරය මගින් දිනකට පුද්ගලයින් 1,500 කට පමණ ජලය පවිත්‍ර කර බෙදා හැරීමේ ධාරිතාවයකින් යුතු වුවද, වර්තමානයේ විශ්වවිද්‍යාලයේ 4,800 වන සිසුන් සහ කාර්ය මණ්ඩලයකට දෛනිකව සහ බාහිර අධ්‍යයන අංශයේ 2,500 ක සිසුන්ට සති අන්ත දිනවල දී ජලය සැපයීම සිදු කරනු ලබයි. පාරිභෝජන අවශ්‍යතාවය මත ජල පවිත්‍රාගාරය පුළුල් නොකිරීමෙන් සෞඛ්‍ය ආරක්ෂිත පානීය ජලය සැපයීම ගැටලුවක් වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ජල පවිත්‍රාගාරයේ ඇලම් මිශ්‍රණය යොදන උපකරණය, වැලි පෙරහන් පද්ධතිය, ක්ලෝරීනීකරණ කුටිය සහ එම ජල පද්ධතියට සම්බන්ධ කරාම 06 ක් 2015 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට අක්‍රිය වී ඇති බැවින් ජලය පවිත්‍ර කිරීමේ පද්ධතිය මගහැර වෙනම නලයක් මගින් හිරිකටුඔයේ ජලය ගබඩා ටැංකියට සෘජුවම ලබා ගෙන එම ටැංකියට ක්ලෝරීන් මිශ්‍රකර විශ්වවිද්‍යාල පද්ධතියට බෙදා හැරීම නිසා සෞඛ්‍ය ආරක්ෂිතව ජලය සැපයීම ගැටලුවක් වී තිබුණ ද , ඉහත අඩු පාඩු සහිත ජල පවිත්‍රාගාරය පිළිසකර කිරීමට විගණිත දිනය වූ 2016 ජුනි 10 දින දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) හිරිකටුඔයේ ජලය, ජල පවිත්‍රාගාරය මගින් පවිත්‍රකර බෙදාහැරීමට කටයුතු කර නොමැති අතර විශ්වවිද්‍යාල පද්ධතියට බෙදාහරිනු ලබන ජලයේ බැක්ටීරියා සම්බන්ධයෙන් සිදුකරන මාසික පරීක්ෂණ වාර්තා අනුව අවස්ථා 06 කදී පානීය ජලයේ සම්මත ප්‍රමාණ ඉක්මවා “coliform bacteria”සහ පානීය ජලයේ නොතිබිය යුතු “E.coli bacteria”තිබූ බව තහවුරු වී තිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන වටිනාකම රු.8,362,184 ක්වූ අරමුදල් 11 ක් ඒවායේ අරමුණුවලට නොයොදවා වසර 02 සිට වසර 05 දක්වා අක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂි විද්‍යාපීඨයේ ගොවිපල පරිශ්‍රය තුළ ඇති දේශන ශාලාව සඳහා 2015 ජූලි මාසයේ මිලදී ගන්නා ලද රු.490,560 ක වටිනාකමකින් යුත් දේශන ශාලා පුටු 100 ක් හා 2015 සැප්තැම්බර් මාසයේදී මිලදී ගන්නා ලද රු.38,000 ක වටිනාකමකින් යුත් කථික වේදිකාව විගණිත දිනය වූ 2016 ජූනි 10 දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) කෘෂි විද්‍යාපීඨයේ මුංගස්තැන්න පරිශ්‍රයේ නව ආපනශාලාව අසල සවිකර ඇති හරිතාගාරය 2014 වර්ෂයේ සිට ඵලදායි කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය සතු ප්‍රධාන ගබඩාව හා උප ගබඩා තුළ වටිනාකම රු.324,607 ක් වූ භාණ්ඩ තොග වර්ෂ 2 සිට වර්ෂ 15 දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) වෙළඳපල වටිනාකම රු.1,000,000 ක් වූ ගලි බවුසරය 2005 වර්ෂයේ අලුත්වැඩියා කර තිබුණද එම වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන ගරාජය තුළ නිශ්ක්‍රීයව තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) විශ්වවිද්‍යාලීය ප්‍රධාන සැලැස්මට (Master Plan) පරිබාහිරව නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව අමතර සිසුන් බඳවා ගැනීමේ අපේක්ෂාවෙන් රු.8,834,437 ක් වැය කර 2014 වර්ෂයේ ඉදිකරන ලද කෘෂි විද්‍යා පීඨ දේශන ශාලාව සහ කෘෂි විද්‍යා පීඨ මුංගස්තැන්න ආපන ශාලාව ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2005 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ලක් හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා උපදේශන ගාස්තු හා සමරු ඵලකය වෙනුවෙන් 2005 වර්ෂයේදී රු.3,337,508 ක් වැය කර තිබුණද, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එබැවින් නැවතත් 2007 වර්ෂයේදී නැවතත් අමාත්‍ය මණ්ඩලය මගින් ඉදිකිරීම් කටයුතු සඳහා අනුමැතිය ලබාදී තිබුණද විගණිත දිනය වූ 2016 මැයි මාසය දක්වාම කිසිදු කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩාගාරය ඉදිකිරීම වෙනුවෙන් රු.123,052,693ක පිරිවැයක් 2014 වර්ෂයේ දරා තිබුණද, ක්‍රීඩා පිටියේ වැසි ජලය නිසි පරිදි බැස නොයාම හා බොරළු මිශ්‍ර පස් යොදාගෙන ක්‍රීඩා පිටියේ මතු පිට සංවර්ධනය කිරීම හේතුවෙන් පස් තද වී මතු පිට දැඩි (HARD) ස්වභාවයක් පෙන්නුම් කළ අතර ක්‍රීඩාගාරය අසල පැති බැම්ම පුපුරා ගොස් තිබීම පිළිසකර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 07 ක සහ කථිකාචාර්ය තනතුරු 10 ක පුරප්පාඩු පැවතුණි. මේ හේතුවෙන් වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන් වෙත රු.16,181,695 ක් ගෙවා තිබුණි. අධ්‍යයන කාර්යය මණ්ඩල තනතුරු තුළ තාවකාලික කථිකාචාර්යවරුන් 14 ක සහ තාවකාලික ශිල්ප ප්‍රදර්ශකවරුන් 24 ක අතිරික්තයක්ද නිරීක්ෂණය විය.

(ආ) පරිපාලනමය තනතුරු 07ක්, අධ්‍යයන සහාය කාර්යය මණ්ඩල තනතුරු 31ක් සහ අනධ්‍යයන තනතුරු 74 ක් වශයෙන් පුරප්පාඩු 112ක් තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා වශයෙන් රු.14,188,740 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 11 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.2 සංයුක්ත සැලැසුම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 අගෝස්තු 30 දිනැති පාලක සභා තීරණ 14.199.61 යටතේ අනුමත කළ 2014 - 2018 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 14 ක් ඉටුකර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යථෝක්ත සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකරගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයිමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම හා ඊට අදාල තීරණ ගැනීම සඳහා උපාය මාර්ගික කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබූ නමුත් එම කමිටුව මගින් සැලැස්මේ ක්‍රියාකාරකම් 150 කින් 97 ක් විගණිත දිනය වූ 2016 ජුනි 10 දක්වා සමාලෝචනය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව 2015 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර 2015 වර්ෂයේ භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්යසාධන වාර්තාද පිළියෙල කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයකු සහ ලිපිකරුවෙකු පමණක් සේවයේ යොදවා තිබෙන නමුත් අභ්‍යන්තර විගණන අංශය විසින් විෂය පථය සලකා ප්‍රමාණවත් ආවරණයක් සිදුවී නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට, අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කිරීමට හා සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු 16 කට අදාලව ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.6 අයවැය ලේඛනමය පාලනය**

ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 6 ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 13 සිට සියයට 131 දක්වා වූ විචලනයන් සහ ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 35 සිට සියයට 91 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ලබා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් කළමනාකරණය | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත නොකිරීම. |
| (ආ) ගබඩා පාලනය | තොග සත්‍යාපනයක් සිදු නොකිරීම සහ අවශ්‍යතාවය හඳුනාගෙන තොග ඇණවුම් නොකිරීම. |